**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1980 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතන නියමාවලියේ 20 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ

පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා වසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි.වරදවා දැක්වීමෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයනගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, හෝ ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේදී ත්‍යාගයක් ලෙස ලැබී තිබුණු ගොඩනැගිල්ලේ තක්සේරු වටිනාකම රු. 116,564,463 ක් ත්‍යාග හා ප්‍රදාන ගිණුමට හර කරනු වෙනුවට ප්‍රාග්ධන ප්‍රදාන වියදම් (Capital Grant Spent) ගිණුමට හර කර තිබීම හේතුවෙන් එම ගිණුම් දෙක ඊට සමාන අගයකින් පිළිවෙළින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2020 වර්ෂයේදී ගොඩනැගිල්ල ක්‍රමක්ෂය කිරීම ආරම්භ කල අතර එය අදාළ වත්කමට (Gift & Donations) ගැලපීම සිදු නොකොට ප්‍රාග්ධන ප්‍රදාන වලට ගලපා තිබුණි. 2020 තෙක් අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්තියම ඉදිරියට ගෙන ගියෙමි. එම ගැලපුම 2022 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාග්ධන ප්‍රදාන වියදම් (Capital Grant Spent) ගිණුමෙහි බැර ශේෂයක් පැවතිය යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දිනට එම ගිණුමෙහි රු. 32,092,188 ක අසාමාන්‍ය හර ශේෂයක් පැවතුණි. | 2020 වර්ෂයේ වියදම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය රු. 8,906,970 ලෙස හා 2021 වර්ෂයේ රු. 32,092,188 ලෙස ඍණ ශේෂයක් දැක්වෙන්නේ ප්‍රාග්ධන ක්‍රමක්ෂය ගැලපීම මගිනි. 2020 තෙක් අනුගමනය කළ ගැළපීම 2021 වර්ෂයේ දී ද එපරිදි ම සිදුකළ බැවින් එම ද්විත්ව සටහන් තැබීමේදී සිදුවූ වර්ගීකරණ දෝෂය, 2022 අවසාන ගිණුම් තුලින් නිවැරදි කිරීමට කටයුතු සිදු කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,657,203 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 7,181,363ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,838,566 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන වියදම් සඳහා වූ රජයේ ප්‍රදාන වැඩිවීම හා පාඨමාලා ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 3,435,527 ක් වූ පර්යේෂණ ප්‍රදාන 10 ක් අදාළ කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ කොරෝනා වසංගතය හේතුවෙන් එක් එක් පරීක්ෂණ සඳහා වූ ප්‍රතිපාදන භාවිතය ඉතාමත් සීමිත තත්ත්වයන් මත සිදුකරනු ලැබේ. අදාළ ක්ෂේත්‍ර වලින් සාම්පල් ලබාගැනීමට නොහැකි වීම නිසා හා මෙම පර්යේෂණ සඳහා අදාළ රසායන ද්‍රව්‍ය සැපයුම් කරන්නන්ගෙන් ලබාගැනීමට නොහැකි වීමත් පිටරට සිට පැමිණෙන විද්‍යාඥයන්ට මෙරටට ඒමට නොහැකි වීමත් නිසා එම පර්යේෂණ කටයුතු 2022 වර්ෂය සඳහා කල් දමන ලදී. | අරමුණුගත කාර්යයන් හඳුනාගෙන සැලසුම්ගතව වැය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය තුළ පැවති එකතුව රු.549,616 ක් වූ තොග අයිතම් 85 ක් 2021 වර්ෂයේදී ද උපයෝජනය කිරීමෙන් තොරව ගබඩාව තුළ නිෂ්කාර්යව පැවතුණි. | ඇතැම් සිසුන් (MLS, CMI අංශවල) සඳහා ව්‍යාපෘතියේ ආරම්භයේදී තොග තබා ගැනීමට සිදුවන අතර එම සිසුවාගේ අධ්‍යාපන කටයුත්ත නිමා වන තෙක් ඔහු වෙනුවෙන්ම ඒවා පැවතිය යුතුය.<br>සමහර අධ්‍යයන ව්‍යාපෘති කල් දැමීමට සිදුවිය. එවිට ව්‍යාපෘතිය අවසන් වන තුරු තොග භාවිතා නොකර තබා ගන්නෙමු.<br>ඇතැම් භාණ්ඩ ඒ ඒ කාර්යමණ්ඩල සඳහා ඔවුනට ආවේණික පර්යේෂණ සඳහාම යොදාගනී. | නිසි අවශ්‍යතාවයන් හඳුනාගෙන මිල දී ගැනීම් සිදු කළ යුතු අතර ඒවා අදාළ කාර්යයන් සඳහා උපයෝජනය කළ යුතුය. |